**බියගම ප්‍රාදේශීය සභාව**

**ගම්පහ දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 දිනද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 01 දිනද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූලි 08 දින සභාවේ ලේකම්වරයා වෙත යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

----------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට බියගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයට අදාළ පුස්තකාල සමීක්ෂණයේදී පරිහරණයට නුසුදුසු බව හඳුනාගත් වටිනාකම රු.101,098 ක් වූ පොත් 1216 ක් පරිග්‍රහණ ලේඛනවලින් ඉවත්කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ ගිණුම්වලින් ඉවත්කර නොතිබුණි.

(ආ) 2015 වර්ෂය තුළදී පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් (බස්නාහිර) පරිත්‍යාග ලෙස ලද පෝටෝන් බැකෝ ලෝඩරයේ සහ පෝටෝන් ලොරි රථයේ වටිනාකම ගිණුම්ගත කිරීම වෙනුවට රක්ෂිත වටිනාකම වූ රු.19,695,000 ක් ප්‍රාග්ධන ගත කර තිබුණි.

(ඇ) 2015 වර්ෂය තුළදී මිලදී ගන්නා ලද රු.450,860 ක්වූ ආයුධ, ආම්පන්න හා රු.345,835 ක් වූ වෙනත් උපකරණ තොගයක වටිනාකම් සමාලෝචිත වර්ෂයේදී ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) 2015 නොවැම්බර් 13 දින වැඩ නිම කරන ලද වටිනාකම රු.14,398,398 ක්වූ ගල් ඒදණ්ඩ සේපාල කනත්තේ ආදාහනාගාරය ඉදිකිරීම සමාලෝචිත වර්ෂයේ ඉඩම් හා ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි.

( ඉ) ශේෂ පිළිබඳ පසු විපරම් සිදු කිරීමක් හෝ පළාත් පාලන කොමසාරිස් ගේ අනුමැතියකින් තොරව රු.6,748,289 ක් වූ අක්‍රීය ණයහිමි ශේෂය ජ'නල් සටහන් 52 මගින් සමුච්චිත අරමුදලට ගැලපුම් කර තිබුණි.

(ඊ) 2015 ජනවාරි 01 දිනට කර්මාන්ත හා ව්‍යාපාර බදු හිඟ ශේෂය හා තුරු සෙවණ ( කාමර) හිඟ ශේෂය පිළිවෙලින් රු.1,330,860 ක් හා රු.269,760 ක් පැවති අතර එම ශේෂයන් 2015 වර්ෂයේදී ගිණුම්වලට ගෙන නොතිබුණි.

1.3.2 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා රු. 26,410,282 ක්වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 88,209,496 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 25,624,929 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

2.2.1 **ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම හා හිඟ ආදායම්**

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට හිගය |
|---|---|---|---|
| | රු.000' | රු.000' | රු.000' |
| වරිපනම් හා බදු | 66,843 | 72,775 | 51,061 |
| බදු කුලී | 4,190 | 2,491 | 4,078 |
| වෙළඳ බලපත්‍ර | 2,736 | 688 | 3,759 |

2.2.2 **වරිපනම් බදු**

2015 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි වරිපනම් හා බදු ශේෂය වූ රු.51,061,827 තුළ වර්ෂ 05 ට වැඩි හිඟ ශේෂය රු.12,478,121 ක්ද, වර්ෂ 03 ත් 05 ත් අතර හිඟ ශේෂය රු.27,656,193 ක්ද විය.

2.2.3 **කර්මාන්ත හා වෙළඳ බලපත්‍ර**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 වර්ෂය වෙනුවෙන් කර්මාන්ත හා වෙළඳ ස්ථාන සමීක්ෂණයක් කර තිබුණද සමීක්ෂණයෙන් හඳුනාගනු ලැබූ ව්‍යාපාරික ස්ථාන 453 ක වෙළඳ බලපත්‍ර ගාස්තු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දෙල්ගොඩ උප කාර්යාල බල ප්‍රදේශයේ ව්‍යාපාරික ස්ථාන 1673 ක රු.1,330,860 ක හිඟ ශේෂයක්ද කඩවත උප කාර්යාල බල ප්‍රදේශයේ රු.772,200 ක කර්මාන්ත හා ව්‍යාපාර බදු හිඟ ශේෂයක්ද වසර 5 ඉක්මවා ඇතත් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. මෙම ව්‍යාපාරික ස්ථාන පිළිබඳව කරනලද සමීක්ෂණයට අනුව ව්‍යාපාරික ස්ථාන නොමැති බවත් අදාල ව්‍යාපාරිකයන්ද සොයාගැනීමට නොහැකි බවත් ලේකම්වරිය 2016 ජුනි 29 දින මා වෙත දන්වා එවා තිබුණි.

2.2.4 **<u>බදුකුලී</u>**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) දෙල්ගොඩ උප කාර්යාල බල ප්‍රදේශයට අයත් පෞද්ගලික ඉඩම් සභාව විසින් බදු කුලී පදනම මත ලබා ගෙන මස් වෙළඳසැල්, මාළු වෙළඳසැල් හා පොළ පවත්වාගෙන යාම සඳහා ටෙන්ඩර් කර බාහිර පාර්ශවයන්ට ලබා දී තිබුණු අතර, ඒ සඳහා සභාවට ලැබියයුතු රු.1,654,612 ක බදු කුලිය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙම ව්‍යාපාරික ස්ථාන පිළිබඳව පරීක්ෂාවේදී එවැනි ස්ථානවල එනමින් සිටි පුද්ගලයින් නොමැති හෙයින් හිග මුදල් අයකර ගැනීමට නොහැකි බව ලේකම්වරිය මා වෙත දන්වා තිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට සභාවේ හිග හිටි වෙළඳ ස්ථාන කුලිය රු.5,712,265 ක් වූ අතර, මෙම ශේෂය තුළ කඩවත වෙළඳපොළ භූමියේ වෙළඳසැල් බදු දීමෙන් අයවියයුතු වසර 5 ඉක්මවන හිග හිටි බදු කුලී ශේෂය රු.2,041,689 ක් ද වසර 1 සිට වසර 5 දක්වා වූ හිග හිටි කඩ කුලී ශේෂය රු.2,668,432 ක් ද විය.

(ඇ) ප්‍රාදේශීය සභාව සතු බියගම බණ්ඩාරවත්ත තුරු සෙවණ වෙළඳසැල් 2012 වර්ෂයේදී කඩා ඉවත්කර තිබූ අතර, වෙළඳසැල් 22 කින් මාස 11 සිට මාස 46 දක්වා අයවියයුතු හිග හිටි කඩ කුලී මුදල රු.343,700 ක් විය. එම මුදල් අයකර ගැනීමට 2016 ජූනි 8 දක්වා ක්‍රියා කර නොතිබුණි. මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සංවර්ධන කටයුතු කිරීමේ දී තක්සේරු වටිනාකම මත වන්දි ගෙවීම සඳහා 2013 වසරේදී රුපියල් ලක්ෂ 15 ක මුදලක් සභාවට ලැබී ඇති බව ලේකම්වරිය මා වෙත දන්වා තිබුණි.

(ඈ) 1980 දෙසැම්බර් 31 දිනැති 1980/46 අංක දරන පළාත් පාලන කොමසාරිස්ගේ " කඩ කාමර බදුදීම සඳහා වූ " චක්‍රලේඛය ප්‍රකාර යටත් පිරිසෙයින් පස් වසරකට වරක්වත් එකී තක්සේරු ගත බදු කුලිය සංශෝධනය කළ යුතු වුවත් කඩවත උප කාර්යාලයට අයත් පොදු වෙළඳ පොළ භූමියේ වෙළඳ සැල් 58 ක් සම්බන්ධයෙන් අවසන් කඩ කුලී තක්සේරුව 2008 වසරේ සිදුකර තිබුණි.

2.2.5 **<u>උසාවි දඩ මුදල්</u>**

2011 ජනවාරි 13 දිනැති ආදායම් කොමසාරිස්ගේ (බප) අංක බප/ආදා/කො/පොදු ලිපිය පරිදි 1994 අංක 04 දරන උසාවි දඩ මුදල් හා දඩ පැවරීමේ ප්‍රඥප්තිය පරිදි බස්නාහිර පළාතේ පිහිටි අධිකරණ මගින් පනවන ලද දඩ මුදල් ( සුරාබදු ආඥා පනතේ හා විෂම හා අන්තරායක ඖෂධ පනතේ පනවන ලද දඩ) ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින් "දඩමුදල් පනවනු ලැබූ වර්ෂයේ දෙසැම්බර් 31 දින සිට වර්ෂ 05 ක් ඇතුළත අයකර ගැනීම සඳහා අධිකරණයේ රෙජිස්ට්‍රාර් විසින් හෝ ඔහු විසින් නම් කරන ලද නිලධාරියෙකුගේ සහතික කරන ලද ලේඛන සහිතව අදායම් කොමසාරිස් (බ.ප.) වෙත ඉල්ලීම් කළ යුතු වුවද, ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

2.2.6 **<u>සම්ප්‍රේෂණ කුළුණු ගාස්තු</u>**

ශ්‍රී ලංකා ජනරජයේ 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන විශේෂ ගැසට් නිවේදනයේ V වන උප ලේඛනය (3 වන නියෝගය) පරිදි සභා බල ප්‍රදේශය තුළ ඇති සම්ප්‍රේෂණ කුළුණු සියල්ල හඳුනාගෙන උප ලේඛනය ප්‍රකාරව ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි.2015 දී කඩවත, මාකොළ උප කාර්යාල විසින් කුළුණු 7 ක් හඳුනාගෙන ඇති අතර ගැසට් නිවේදනය ප්‍රකාරව අය කිරීම් කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

ප්‍රාදේශීය සභාව සතු යතුරු පැදිය හා අත්ට්‍රැක්ටර් දෙක වසර 10 කට පමණ පෙර සිට නිශ්ක්‍රීයව කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමකින් තොරව ගබඩාව තුළ අබලි ද්‍රව්‍ය අතර දිරාපත්වෙමින් පවතින බවත්, කුණු කසල ප්‍රවාහනයට යොදාගත හැකි ආවරණය කරන ලද ට්‍රැක්ටර් ට්‍රේලරයක් ඌන උපයෝජිතව කුණු කසළ තාවකාලිකව රඳවා ගන්නා පරිශ්‍රයෙහි දිරාපත් වෙමින් පවතින බවත් 2016 ජූනි 08 දින කරන ලද භෞතික විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

### 3.2 ආර්ථික නොවූ ගණුදෙනු

සභාව සතුව ට්‍රැක්ටර් 9 ක් ත්‍රී රෝද රථ 4 ක් යතුරු පැදි 4 ක් වශයෙන් ප්‍රමාණවත් වාහන සංඛ්‍යාවක් තිබියදී සමාලෝචිත වර්ෂයේදී සෞඛ්‍ය, මාර්ග, විදුලි අංශ සඳහා කුලී පදනම මත ට්‍රැක්ටර් 8 ක්, ටිපර් එකක්, ලොරි රථයක් සහ ත්‍රී රෝද රථ 4 ක් කුලී පදනම මත ලබා ගෙන ඒ සඳහා රු.7,219,150 ක් කුලී වශයෙන් ගෙවා තිබුණි.

### 3.3 අවිධිමත් ගනුදෙනු

(අ) සැලසුම් කමිටුවලට සහභාගී වීම වෙනුවෙන් රු.376,700 ක් ගෙවීම් කර තිබූ අතර සැලසුම් කමිටුවලට සහභාගීවීම පිළිබඳව සනාථ කෙරෙන පැමිණීම පිටවීම පිළිබඳ ව සටහන් කෙරෙන වාර්තාවල ( ලේඛනය හා ඇඟිලි සළකුණු යන්ත්‍රය) පරස්පර තාවයන් තිබූ අතර ඇඟිලි සළකුණු යන්ත්‍රය භාවිතා කර නොතිබූ අවස්ථාද විය.

(ආ) සමාලෝචිත වර්ෂයේදී අක්කර 4 රූඩ් 3 පර්චස් 2.70 කින් යුක්ත බෙදුම් සැලැස්ම අනුමත කිරීමේදි පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 1996 අගෝස්තු මස 06 දිනැති අංක 935/6 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් නිවේදනයේ නියෝග 22(1) ප්‍රකාරව ප්‍රජා විනෝද කටයුතු සහ එළිමහන් ප්‍රදේශ වශයෙන් භාවිතා කිරීමට පොදු පහසුකම් සඳහා සියයට 10 ක ප්‍රමාණයක් වෙන්කර ඔප්පුවක් මගින් ප්‍රාදේශීය සභාව වෙත පවරා දියයුතු වුවත් විගණිත දිනය වූ 2016 ජූනි 08 වන විටත් එය පවරා දී නොතිබුණි.

(ආ) ඉඩමේ අනු බෙදුම් සැලැස්මට අදාළ පහත සඳහන් සංවර්ධන කටයුතු කිරීම් කළ යුතු වුවත් 2016 ජූනි 08 දින භෞතික පරීක්ෂාවේදී එම කටයුතු සිදුකර නොමැති බව නිරීක්ෂණය විය.

i. ජල නල පහසුකම් හා විදුලිය ලබාදීම.

ii. ස්වභාවික ජලය බැස යාම සඳහා කාණු කොන්ක්‍රීට් දමා සකසා උගුල් සහිතව ඉදිකළ යුතු වුවත් පාරේ එක් පැත්තක කාණු දමා තිබුණු අතර, පාර කොන්ක්‍රීට් හෝ තාර දමා නොතිබීම.

iii. පාර මතුපිට කුඩා කොන්ක්‍රිට් ගල් අතුරා තිබූ අතර, එම ගල්ද වැසි ජලයට සෝදා ගොස් තිබීම.

iv. ප්‍රජා කටයුතු සඳහා සුදුසු ප්‍රශස්ත ඉඩමක් සභාව වෙත වෙන්කර දියයුතු වුවත් ලොට් අංක 20,37,55 වශයෙන් ස්ථාන 03 කින් පර්චස් 57.6 ක ප්‍රමාණයක් වෙන්කර තිබුණි. පර්චස් 10.6 කින් යුත් ලොට් 20 කැබැල්ල පමණක් කොන්ක්‍රීට් ගල් බැම්මකින් වටකර තිබුණු අතර පර්චස් 37 කින් යුත් ලොට් අංක37 කැබැල්ල බෑවුම් සහිත ත්‍රිකෝණාකාර භූමි

ප්‍රමාණයක් විය මේ අනුව ස්ථාන තුනකින් පොදු පහසුකම්වලට අදාළ කොටස් වෙන්කර තිබීම හේතුවෙන් අදාළ අරමුණ ඉටු නොවන බව නිරීක්ෂණය කෙරේ.

v. කාර්මික නිලධාරී වැඩ අධිකාරී විසින් මෙම ඉඩමේ සංවර්ධන කටයුතු සිදුකර ඇති බව සඳහන් කර නිර්දේශ කර තිබූ අතර ලේකම්වරිය විසින් 2016 මාර්තු 31 දින ඉඩම් අනුබෙදුම් අනුමැතිය ලබා දී තිබුණි.

vi. ගම්පහ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ 2016 ජූනි 15 දින ලබා ගත් තොරතුරු අනුව මෙම ඉඩමේ කැබලි 5 ක එකතු විකුණුම් මිල රු.16,214,000 ක් වශයෙන් දැක්වුනු අතර, ඒ අනුව අයවියයුතු සියයට 1 බදු මුදල රු.162,140 ක් වුවත් සභාව විසින් අයකර තිබුණේ රු.54,285 ක දළ ඇස්තමේන්තු මුදල පමණක් විය.

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනය

(අ) දින 100 විශේෂ සංවර්ධන වැඩ සටහනට සමගාමීව ගම් නගා සිටුවීමේ වැඩ සටහන යටතේ පහළ බියන්විල නැගෙනහිර පිංතාලිය පාර බෝක්කුව නවීකරණය කිරීම, පහළ බියන්විල නැගෙනහිර ප්‍රජා ශාලාව නවීකරණය කිරීම සහ බියගම බටහිර සමගි සුභ සාධක සමිති ශාලාව පහත මාලය ඉදිකිරීම යන ව්‍යාපෘති තුන ඇස්තමේන්තු සකස්කර තිබියදීත් වර්ෂය තුළ ඉදිකිරීම් සිදුකිරීමට නොහැකි වීම නිසා 2016 පෙබරවාරි 11 දින අංක බිය/4/5/ගම්.න.වැ./2015 දරන බියගම ප්‍රාදේශීය ලේකම්ගේ ලිපිය මගින් එම ව්‍යාපෘති අවලංගු කර තිබුණි.

(ආ) දින 100 විශේෂ සංවර්ධන ව්‍යාපෘතියට සමගාමීව ගම් නගා සිටුවීමේ වැඩ සටහන යටතේ මාර්ග කිහිපයක් දින 2 ක් හා 3 කින් කොන්ක්‍රීට් කර අවසන් කර තිබුණු අතර එම මාර්ගවල ප්‍රමිතිය පිළිබඳ විගණනයේදී මතභේදයට ලක්විය. උදාහරණ දෙල්ගොඩ අළුබෝවිල කොට්ඨාශහේන පාර කොන්ක්‍රීට් කිරීම, දරණගම කනත්ත පාර කොන්ක්‍රීට් කිරීම, ගල්වල පාර පහළ කොටස මීටර් 350 කොන්ක්‍රීට් කිරීම

## 3.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) 2015 මාර්තු 17 දිනැති දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ ලිපියෙන් 2010 හා 2011 වර්ෂවලට අදාළව පැහැර හරිනු ලැබූ බදු ලෙස රු.1,580,069 ක මුදලක් ගෙවියයුතු බව දන්වා තිබූ අතර, එය නිරවුල් කර ගැනීම සඳහා 2015 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී කාර්යාල උපකරණ මිලදී ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 ඡේදය ප්‍රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබූ අතර මිල කැඳවීමේ ලිපිවල පිරිවිතර සඳහන් කර නොතිබුණි. අවම මිලගණන් ප්‍රතික්ෂේප කිරීමට සාධාරණ හේතු ඉදිරිපත් කිරීමකින් තොරව භාණ්ඩ මිලදී ගෙන තිබූ අතර, එහිදී රු.61,889 ක මූල්‍ය පාඩුවක් සිදුවී ඇති බව නිරීක්ෂණය විය.

(ඇ) 2006 මාර්තු 01 දිනැති රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය ප්‍රකාරව අවම වශයෙන් වසර 3 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සහ ඉදිරි වර්ෂය සඳහා වූ විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 3.6 **සන අපද්‍රව්‍ය කළමනාකරණය**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) කසල වර්ගීකරණය කර කොම්පෝස්ට් නිපදවීම සඳහා කොම්පෝස්ට් අංගනයක් ඉදිකිරීමට අක්කර 4 රූඩ් 2 පර්චස් 12.35 ක්වූ පස් කපන ලද මුඩු ඉඩම ප්‍රාදේශීය සභාවට අත්පත් කර ගැනීමට 2014 වර්ෂයේ සභා අනුමැතියක් ලබා ගෙන තිබූ අතර ඒ සඳහා රුපියල් කෝටියක මුදලක් වෙන්කර තිබුණි. 2014 වර්ෂයේදී ඉඩම අත්පත් කර ගැනීම සඳහා පළාත් සභා සහ පළාත් පාලන ලේකම්ගේ අනුමැතිය ඉල්ලා තිබූ අතර, 2014 සැප්තැම්බර් 01 දින අයදුම්පතෙහි අඩුපාඩු සකසා නැවත එවන ලෙස සභාවට දැනුම් දී තිබුණි. එහි සඳහන් අඩුපාඩුවක් වශයෙන් දක්වා තිබූ ඉඩමේ දළ වටිනාකම පාදක කරගත් උපයෝගී ලේඛන සපුරා ගැනීම සඳහා 2014 සැප්තැම්බර් 10 දින ඉඩම තක්සේරු කර දෙන ලෙසට ඉල්ලීමක් කර තිබුණු අතර, තක්සේරු වාර්තාව 2016 පෙබරවාරි 11 දින ලැබී තිබුණි. ඉඩම පවරා ගැනීමට 2015 අයවැයෙන් මුදල් වෙන්කර නොතිබුණි.

(ආ) ඉඩම පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු නොකොට කසල රැගෙනයාම සඳහා පුද්ගලික ආයතනයකට භාරදී තිබුණි. සභාවේ ට්‍රැක්ටර් සහ කුලී ට්‍රැක්ටර් වලින් කසළ සභාව පිටුපසට ප්‍රවාහනය කරනු ලබන අතර, කොන්ත්‍රාත්කරුගේ වාහනවලට කසල පැටවීමද ප්‍රාදේශීය සභාව විසින් කළ යුතු විය. කොන්ත්‍රාත්කරු විසින් එම ස්ථානයෙන් ඉවත් කර ගන්නා සෑම කුණු කසළ ලෝඩ් 1 කට රු.11,900 ක් ගෙවා තිබුණි. කසළ සභාවේ ආදායම් මාර්ගයක් වියයුතු වුවද, විගණිත දිනය වූ 2016 ජූනි 08 දින වන විට කසළ අපහරණය සඳහා රු.30,238,460 ක් (දළ වශයෙන්) වැය කර තිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභා පරිශ්‍රයට කසළ ගෙනවිත් බෑම නිසා එහි දුර්ගන්ධය කාර්යාලයට හා අවට නිවෙස්වලට පැතිරීම නිසා පාරිසරික ගැටළුවලට මුහුණු දීමට සිදුවී තිබුණු අතර සභාවට මායිම්ව ඇති ඉන්ධන පිරවුම් හලින් සභාවට ඉන්ධන නිකුත් කිරීමද ප්‍රතික්ෂේප කර තිබුණි.

(ඈ) වසර කිහිපයක් තිස්සේ කසළ බැහැර කිරීම පිළිබඳව එකම ක්‍රමවේදයක් අනුගමනය කර තිබූ අතර, අප ද්‍රව්‍ය ජනනය වන ස්ථානවලදීම වර්ගීකරණය කිරීම සිදුකළ යුතු වුවද ප්‍රාදේශීය සභා පරිශ්‍රයේ එදිනෙදා බැහැරලන අපද්‍රව්‍ය පවා වර්ගීකරණය කර බැහැරලීමේ ක්‍රමවේදය ක් 2016 ජූනි 9 දින වන විටත් අනුගමනය කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී කසල අපහරණය සඳහා දරන ලද රු.30,238,460 ක වියදමින් රු.23,037,550 ක වියදමක් සභාව විසින් සභා පරිශ්‍රයට එකතු කරනු ලබන කසළ රැගෙන යාමට පමණක් වැයකර තිබීම (සියයට 76 ක්) විගණනයේදී මතභේදයට ලක්විය.

(ඊ) සන අප ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව 2011 ජූලි 05 දිනැති අංක 1713/11 දරන ශ්‍රී ලංකා ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදනයේ IV ( අ) කොටස සහ සන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා 22 වගන්තිය ප්‍රකාරව සඳහන් කර ඇති කාර්යයන් සැලසුම් කිරීම, අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම කෙරෙහි සභාව පියවර ගෙන නොතිබුණි.

4. **<u>පද්ධති හා පාලන</u>**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) කොන්ත්‍රාත් පාලනය
(ඉ) සන අපද්‍රව්‍ය කළමනාකරණය
(ඊ) මානව සම්පත් කළමනාකරණය
(උ) වාහන උපයෝජනය